# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: **www.pubad.gov.lk** / Web Site


---

මගේ අංකය / எனது இல / My No: CS/ICTS/01/Training Programs
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி: / Date: 2017.09.11

අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ පුහුණු පාඨමාලාවන් සංවිධානය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2017.08.08 දිනැති ලිපිය හා බැඳේ.

02. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් වෙනුවෙන් හඳුනාගන්නා ලද පුහුණු ක්ෂේත්‍රයන්ට අදාල පාඨමාලාවන් සඳහා නිලධාරීන් තෝරා ගැනීම වෙනුවෙන් වූ ලිඛිත පරීක්ෂණයක් **2017.09.23 දින සෙනසුරාදා දින පෙ.ව 10.00** ට **කොළඹ ශාන්ත පීතර විද්‍යාලයේදී** පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

03. මෙම පරීක්ෂණය සඳහා වන ප්‍රවේශ පත්‍රය පහත දක්වා ඇති වෙබ් ලිපිනය මගින් නිලධාරියා/ නිලධාරිණියගේ හැඳුනුම්පත් අංකය යෙදීමෙන් බාගත කල හැකිය. වෙබ් ලිපිනයට අදාල යොමුව මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පල කිරීමට කටයුතු යොදා ඇති බවත් සම්පූර්ණ කරන ලද විභාග ප්‍රවේශ පත්‍රයද සමග නියමිත දිනයේදී පරීක්ෂණයට ඉදිරිපත් වන ලෙස ඔවුනට දන්වන ලෙසත් කාරුණිකව දන්වමි.

**ප්‍රවේශ පත්‍රය ලබා ගත යුතු වෙබ් ලිපිනය : http://203.94.94.214/CS-ICTSERVICE**

04. පුහුණු අවශ්‍යතාවයන් හඳුනාගැනීමේ සමීක්ෂණය සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ සියළු නිලධාරීන් මෙම පරීක්ෂණයට පෙනී සිටීම අනිවාර්යය වන අතර එම පරීක්ෂණයට පෙනී සිටීමට හැකිවන පරිදි අවශ්‍ය රාජකාරි නිවාඩු ලබා දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි. ඒ වෙනුවෙන් නිලධාරීන්ට ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

05. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ වෘත්තීමය නිපුණතාවය සංවර්ධනය වෙනුවෙන් ආරම්භ කිරීමට නියමිත මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**කේ. වී. පී. එම්. ජේ. ගමගේ**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්